ලෙස්ලි ගුණවර්ධන මහතාගේ ජීවිතය පිළිබඳව මේ අවස්ථාවේ විශාල ගුණ කථනයක් කිරීමට අවශ්‍ය කමක් නැතැයි මා හිතනවා. මේ රටේ කම්කරු පන්ති සටන් ඉතිහාසයේ ඔහුගේ නම රන් අකුරින් ලියැවෙනවා ඇති.

ලෙස්ලි ගුණවර්ධන මහත්මයා එක අතකින් බලන විට නිශ්ශබ්ද පුද්ගලයෙක්. විශාල වශයෙන් ප්‍රතිපත්ති ගරුක පුද්ගලයෙක්. මට මතකයි. අප අනෙක් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ ඉන්න කාලයේ ඔහු ඇමති ධුරයක් දරූ අවස්ථාවේදී ඔහුගේ නිල රථයේ ඔහු නැති අවස්ථාවක—ඔහු ගමන් නොකරන අවස්ථාවක—එවකට එම සභාවේම මන්ත්‍රීවරියක් හැටියට සිටි ඔහුගේ බිරිඳට පවා ඔහු නැතිව නිල් රථයේ යෑම තහනම් කර තිබුණා. ඒ තරමට අකුරටම ප්‍රතිපත්ති ගරු කළ පුද්ගලයෙක් හැටියට නම් කරන්නට පුළුවන් කෙනෙක් ඔහුගේ දීර්ඝ දේශපාලන ඉතිහාසය තුළ ඇමතිවරයෙක් වශයෙන් සිටි කාලයේදීවත් කොයි තරම් බලසම්පන්න ධානාන්තර ඔහු ඉසුළුවත්, කිසි කෙනෙකුට ඔහුට විරුද්ධව චෝදනාත්මකව ඇඟිල්ලක් දික් කරන්නට පුළුවන්කමක් නැති වන ආකාරයට ක්‍රියාකළ පුද්ගලයෙක් වශයෙන් ඔහුගේ නම අපේ රටේ දේශපාලන ඉතිහාසයේ ලියැවෙනවා ඇතැයි අප විශ්වාස කරනවා.

ඔහු මුළු කම්කරු පන්ති ඉතිහාසයෙන්ම විශාල වශයෙන් සටන් කළ කෙනෙක් බව අප දන්නවා; අප අසා තිබෙනවා. ලංකා සමසමාජ පක්ෂය විටින් විට රහස් ඡන්දයෙන් තම පක්ෂයේ මධ්‍යම කාරක සභාව තෝරන අවස්ථාවල්වල—අවස්ථාවක්, අවස්ථාවක් පාසා—අවුරුදු ගණනාවක් තිස්සේ රහස් ඡන්දයෙන් සාමාජිකයන්ගෙන් ඡන්දය ලැබූ මධ්‍යම කාරක සභිකයන් අතුරින් පළමුවන ස්ථානය ලෙස්ලි ගුණවර්ධන මහතා ලබා ගැනීමෙන්, ඔහු ඒ පක්ෂයේ සෙබළුන්ගේ විශ්වාසය කොතෙක් දුරට දිනා තිබෙනවා දැයි සිතා ගන්නට පුළුවන් කම තිබෙනවා. පසුගිය දිනවල ලෙස්ලි ගුණවර්ධන මහතා අභාවයට පත් වන විට අප රටේ තිබුනේ දේශපාලන ජීවිතයේ නොයෙක්, නොයෙක් වෙනස් වීම්සිදු වී තිබුණු අවදියක්. සමහර උදවියට ඒ වෙනස්වීම් හොඳ ඒවා හැටියට පෙනෙන්න පුළුවන්. වෙනත් දේශපාලන මත දරන උදවියට ඒ වෙනස්වීම් ආපසු යෑමක් හැටියට පෙනෙන්න පුලවන්. කෙසේ වුණත් ලෙස්ලි ගුණවර්ධන මහත්මයා අපේක්ෂා කළ සමාජයක් අපට මේ රටේ ගොඩනගන්න බැරි වී තිබෙනවා. ඒ නිසා ඒ මහත්මයාගේ අභාවය මේ අවස්ථාවේදී සිදුවීම අපට පාඩුවක්. ඒ මහත්මයා දුන් නායකත්වය, ඒ මහත්මයාගේ ඍජු භාවය, දර්ශනිකයෙකු වශයෙන් පෙන්වූ මග පෙන්වීම්, නොයෙක් අලුත් දේවල් පිළිබඳව කල්පනා කිරීමේදී තිබුණු නම්‍යශීලී භාවය යනාදී සියල්ලක්ම මේ අවස්ථාවේදී නැතිවීම පාඩුවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රටේ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව මම මේ අවස්ථාවේදී කථා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. නමුත් පුදුම දෙයක් හැටියට පෙන්වන්න පුළුවන් දෙයක් සිදු වී තිබෙනවා. ලෙස්ලි ගුණවර්ධන මහත්මයාගේ අභාවය පිළිබඳව සම්ප්‍රදායානුකූලව මේ සභාවේ අපි සියලු දෙනාම—සෑම පැත්තේම උදවිය—එකතු වී මේ ශෝක ප්‍රකාශ යෝජනාව සම්මත කරන අදම—මේ දිනයේම—ලෙස්ලි ගුණවර්ධන මහත්මයාගේ භාර්යාවට—විවියන් ගුණවර්ධන මහත්මියට—පොලිසියෙන් පහර දීම මානුෂික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් හැටියට සුප්‍රීම් උසාවියෙන් තීන්දුවක් දීම—ඒ කරුණු දෙකම සමාන්තරව මේ අවස්ථාවේදී සිදු වීම—සමහර විට අපේ රටේ ඇති වෙන සිදු වීම් ගැන එක්තරා විධියක නිරීක්ෂනයකට භාජන කළ හැකි කාරණයක්ය කියා කියන්න පුළුවන්.

මා මීට වඩා මේ ගැන කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. පෞද්ගලිකවත්, අපේ පක්ෂය වෙනුවෙනුත්, ඒ මහත්මයාගේ පවුලේ උදවියටත්, ඒ මහත්මයාගේ පක්ෂයේ උදවියටත් අපගේ ශෝකය මේ අවස්ථාවේදී පළ කරන්නට අවස්ථාව දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

නිශ්ශංක විජයරත්න මහතා (අධිකරණ ඇමතිතුමා)
(திரு. நிஸங்க விஜயரத்ன—நீதி அமைச்சர்)
(Mr. Nissanka Wijeyeratne–Minister of Justice)

Mr. Deputy Speaker, I would like to take this opportunity of associating myself with the deep sentiments that have been expressed on the passing away of a distinguished Member of Parliament and a great figure in the national life of Sri Lanka.

Mr. Leslie Goonewardene, as pointed out by the other speakers, was amongst the select band that joined together to activate the working class of Sri Lanka against the imperialist rule. Among those fighters Mr. Leslie Goonewardene made rare sacrifices.

He was born to a rich family, a family which at all times followed the Christian principles of charity. Mr. Goonewardene appeared, therefore, in many ways a figure that stood in contradistinction to the familiar environment he belonged to but there was, in the adherence of Mr. Goonewardene to certain principles that marked him and his activities, a continuity in tradition which must be referred to.

He chose the dress of the common man so that he would thus not stand symbolically away from the masses. He chose a humble flower to energize a movement against the British government using that opportunity to focus attention on national urgencies and rights. He was at all times marked with a rare degree of balance, decorum and dignity. The working class movement received much from him, and he also gave them qualities which its wiser leaders have chosen to follow. The degree of pragmatism that marked Mr. Leslie Goonewardene is something that many members who followed Marxist socialism would well do to recognize.

Mr. Leslie Goonewardene was not merely a dignified ornament in this House, a wise and balanced Minister, a courageous and dignified leader, but he was also a good husband and a kind father. One of the real advantageous he had was that all those who came in contact with him remained to respect him, or even though they left the path he had followed, continued to hold him in high regard.

Socialism is not something clung to in desparation by various parties. It, in fact, antedates marxism, and the recognition that socialism divorced from marxism could still serve this country, was the salient characteristics that determined his approach in 1970 when he accepted office and entered Parliament as a Minister, whose record within that Ministry will some day enable researchers to see that there was a man of vision who was also pragmatic enough to realise that without pragmatism no true service can be rendered a country.

To his wife and children we extend our deepest sympathies, and may this House always remember the genteel manners of a great gentleman, a good parliamentarian and a true son of Sri Lanka.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)

(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—அத்தனகல்ல)

(Mr. Lakshman Jayakody–Attanagalla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු ඇමතිවරයකු වූ ලෙස්ලි ගුණවර්ධන මහත්මයාගේ අභාවය ගැන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් අපේ හද පත්ලෙන්ම නැගෙන ශෝකය මේ අවස්ථාවේදී පළ කරනවා.

මේ රටේ දේශපාලන ඉතිහාසයේ විවිධ යුගවල, විවිධ උදවිය පහළ වී තිබෙනවා. එක් දහස් නවසිය තිස් ගණන්වලදී මේ රටේ සිටි ධනවත් පවුල්වල උගත් ළමයින් නව මගක් සොයා ගැනීමේ බලාපොරොත්තුවෙන් විවිධ දේශපාලන න්‍යාය ධර්මයන් හැදෑරීමට අවස්ථාව ලබා ගැනීම සඳහා පිටරට ගියා. ඒ ගිය වකවානුවේදී ඒ රටවල සිටි සමාජවාදී අදහස් දරූ, නැත්නම් විවිධ දේශපාලන මති මතාන්තර දරූ උදවිය මුණගැහෙන්නට, ඒ උදවිය සමඟ සාකච්ඡා කරන්නට අවස්ථාව ලැබුණා. එවැනි අවස්ථාවල් ලැබූ අය වාසනාවන්ත පුද්ගලයන් හැටියට තම තමන්ගේ රටවලට ඇවිත් ඒ රටවලට ගැළපෙන පරිදි විශාල සමාජ පෙරළියක් ඇති කිරීමේ කටයුතුවල නිරත වුණ බව අපට පෙනී ගොස් තිබෙනවා. ඒ යුගයේ ඉතිරි වී තිබුණු පුරුකක් තමයි, ලෙස්ලි ගුණවර්ධන මහත්මයා.

ලෙස්ලි ගුණවර්ධන මහත්මයා සැහෙන ධනවතෙක් බව අපි කවුරුත් දන්නවා. දිවුලපිටිය ප්‍රදේශයේ එතුමාට අයත් ඉඩකඩම් රාශියක් තිබුණ බව විශේෂයෙන්ම ඒ ප්‍රදේශයේ සිටින අය වශයෙන් අපි දන්නවා. ඒ නිසා එතුමා නාගරික පන්තියේ ජීවිතය ගැන දැනගත් කෙනෙකු පමණක් නොව, ගැමි ගතිය, ගැමි වහර යනාදී දේවල් හොඳින් ඉගෙණ ගත් කෙනෙකු හැටියටත් හඳුන්වන්නට අපට පුළුවන්කමක් තිබෙනවා.

එතුමාට න්‍යාය ධර්මයන් සම්බන්ධව හොඳ දැනුමක් අවබෝධයක් තිබුණු බව කවුරුත් දන්නවා. සමාජවාදී න්‍යායයන් සම්බන්ධව ලංකාවේ යම් කෙනෙකු පොත පත ලිව්වා නම් ඒ ලියන කලාවට, හිතුවා නම් ඒ හිතන කලාවට ලෙස්ලි ගුණවර්ධන මහත්මා කෙළින්ම සම්බන්ධ වුණාය කියන එක අපට විශ්වාස කරන්නට පුළුවන්. ඒ අනුව එතුමා ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රතිපත්තීන් හැදුවාය කියන එක කවුරුත් පිළිගන්නා කරුණක්. ලෙස්ලි ගුණවර්ධන මහතාගේ අදහස් ලංකා සමසමාජ පක්ෂයේ අදහස්වලට බෙහෝ විට බලපෑ එක වකවානුවක් තිබුණා. ඒ අනුව ඔහුගේ තිබුණු දක්ෂතාවයන් ලංකා සමසමාජ පක්ෂයට ගැබ් වුණාය කියා අපට හිතන්නට පුළුවන්. නමුත් ලේස්ලි ගුණවර්ධන මහත්මා විධායකයෙක් හැටියට අපට පෙනී පෙණුනේ 1970 න් පසුවයි. ලංගමය ඔහු භාරයේ තිබුණා. ලංගමයේ ස්වර්ණමය යුගයක් තිබුණානම් ඒ ලෙස්ලි ගුණවර්ධන යුගය බව කියන්නට පුළුවන්කමක් තිබෙනවා. එහි ප්‍රධාන විධායකයා හැටියට සිටි නැනැත්තා අද මතුගම ගරු මන්ත්‍රීතුමා (අනිල් මුණසිංහ මහතා) වශයෙන් අප අතර සිටිනවා. ලෙස්ලි ගුණවර්ධන මහතා ගැන අපට වඩා දැනුමක් තිබෙන කෙනෙකු හැටියට ඒ සම්බන්ධව යමක් එතුමාගේ කථාවෙන් අපට අසාගන්නට පුළුවන් වෙයි කියා මම විශ්වාස කරනවා.

ලෙස්ලි ගුණවර්ධන මහත්මා ප්‍රංශයට හුඟාක් ආදරෙයි. ප්‍රංශය සම්බන්ධව විශාල කැක්කුමක් ඇති වීමට, ප්‍රංශ මිත්‍ර සංගම්වල කටයුතු කිරීමට මේ තරම් උනන්දුවක් දක්වන්නේ මොන හේතුවක් උඩද, මොන සම්බන්ධීකරණයක් උඩද කියා මම දිනක් එතුමාගෙන් ඇසුවා. ඒ අවස්ථාවේදී එතුමා විසින් කියන්නට යෙදුනේ එතුමාගේ ජීවිතයට දේශපාලන වශයෙන් යම් හැඟීමක් ආවා නම් එසේ ආවේ ප්‍රංශ විප්ලවයෙන් නිසා එතුමා හැමදම වාගේ ප්‍රංශයේ කෙරෙන කටයුතු, දේශපාලන පෙරළි, ප්‍රංශයේ ඇති වුණු හතර වැනි ජාත්‍යන්තරය යනාදී දේවල් ගැන විශේෂ ළැදියාවක් දක්වන බවයි.

ලෙස්ලි ගුණවර්ධන මහත්මා මේ රටේ උපන් ශ්‍රෙෂ්ඨතම පුද්ගලයින්ගෙන් කෙනෙක්ය කියා අපට හිතන්නට පුළුවන්කම තිබෙනවා. එම නිසා ලෙස්ලිගුණවර්ධන නාමය ලංකා සමසමාජ පක්ෂය තුළ පමණක් නොවෙයි, මේ රටේ නිර්ධන පංතික ජනතාවක් යම්තාක් කල් සිටිනවාද ඒ තාක් කල් අමරණීයව පවතින බව සියලු දෙනාම හොඳ හැටි දන්නා කරුණක්. ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගෞරවයත්, ආචාරයත් එතුමාට දේශපාලන වශයෙන් උදව් උපකාර කළ එතුමාගේ බිරිඳ වන විවියන් ගුණවර්ධන මහත්මියටත්, පවුලේ සියලු දෙනාටත් දන්වා යවන ලෙස මේ අවස්ථාවේදී ඉල්ලමින් එතුමාට නැවත වරක් ආචාර කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ආචාර්ය නීලන් තිරුචෙල්වම් මහතා (වඩ්ඩුක්කෝඩ්ඩෙයි)

(கலாநிதி நீலன் திருச்செல்வம்—வட்டுக்கோட்டை)

(Dr. Neelan Tiruchelvam–Vaddukkoddai)

I wish to join in the eloquent tributes paid to one of the mandarins of the traditional Left in this country who for more than half a century served the Left movement with distinction and with dignity.

Mr. Leslie Goonewardene was a product of the traditional establishment in this country. He was educated at St. Thomas' College and later proceeded to public school in Wales, joined the University of London, and was called to the Bar in one of the Inns of Court. But throughout his life he moved away from the orthodox Methodist upbringing of his parents and unstintingly gave of his time and his energies and worked towards the cause of the under-privileged and the socially disadvantaged. He waged a struggle against the establishment, and when his political party was proscribed in 1941 he continued, as a political fugitive, to struggle against the colonial rulers of that time.

Mr. Leslie Goonewardene characterized a concept of politics with exalted ideas, a capacity for ideas, to bring about a social and economic transformation. He was heavily influenced by the current of intellectual thought in England at the time of his education, and thereafter he contributed towards shaping the dominant political and economic ideas of our political history. The nascent ideas of the nationalist movement, the competitive political process, the universalization of adult franchise, the role of the public sector in a mixed economy, the concepts of worker-participation and co-determination have at various times been influenced by his thoughts and his writings.

He was a person of rare intellectual attainments. Clarity of thought and vigour of analysis characterized his speeches and his writings. He had a mastery of a number of languages, modern languages, both Western and Eastern.

Sir, above all, I do not think that in half a century of political life you could identify a person on whom not the slightest aspersion could be cast on his political integrity or his commitment to ideals. Leslie Goonewardene was such a rare man. He stood above, as the hon. Member for Nallur has mentioned, the passions and emotions of his time and identified himself with the quest of equality, dignity and freedom of the Tamil-speaking people of this country.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය නීලන් තිරුචෙල්වම් මහතා]

Sir, his loss is not only felt by the Left movement in this country ; but as a pamphleteer and as a writer he shaped the political ideas and economic concepts which leave an indelible impression on our lives.

දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)
(திரு. தினேஷ் குணவர்த்தன—மஹரகம)
(Mr. Dinesh Gunawardena–Maharagama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන ශෝකප්‍රකාශ යෝජනාවට හවුල් වීමට අවස්ථාවක් ලැබීම අගය කොට සලකන අතර, මහජන එක්සත් පෙරමුණ වෙනුවෙන් අපගේ ගෞරවය එතුමාට පුද කරනවා. ලෙස්ලි ගුණවර්ධන මහත්මයා පිළිබඳව දීර්ඝ විස්තරයක් කිරීමට නොවෙයි අපගේ උත්සාහය. ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා එංගලන්තයේ සිටින අවධියේදී මගේ ආදරණීය පියාත් සමග එවකට මේ රටේ පැවැති සමාජය සහ අධිරාජ්‍යවාදී බලය වෙනස් කිරීම සම්බන්ධයෙන් කරන ලද මූලික සාකච්ඡාව අනුව, ඒ දෙදෙනා එංගලන්තයේ සිටි තවත් තරුණයන් එකතු කරගෙන මේ රටට ඇවිත් අලුත් දේශපාලන පක්ෂයක් වශයෙන් සංවිධානය වී, විශේෂයෙන් සුද්දන්ගේ බලය මේ රටින් එලවීමත් මේ රටේ තිබුණු අයුතු, අසාධාරණ සමාජ ක්‍රමය වෙනස් කිරීමත් අරමුණු කරගෙන ලංකා සමසමාජ පක්ෂය ආරම්භ කරන්නට යෙදුනා. එද එංගලන්තයේදී ඒ තීරණය ගත් පුද්ගලයන්ගෙන් ලෙස්ලි ගුණවර්ධන මහතා ද කෙනෙක් බව අප අමතක නොකළ යුතුයි.

ඒ අමාරු අවධියේදී ඒ ආරම්භකයන්ගෙන් කෙනෙක් හැටියට ලෙස්ලි ගුණවර්ධන මහත්මයා අනෙක් අයට කලින් ලංකාවට පැමිණියා. සමසමාජ ව්‍යාපාරයේ ආරම්භක කටයුතු සියල්ලේ මූලික හවුල්කරුවන්ගෙන් එක් කෙනෙක් වූ ලෙස්ලි ගුණවර්ධන මහත්මයා, මේ රටේ ස්වරාජ්‍යය පිළිබඳ ප්‍රශ්නයේදී, මේ රටට ඩොමීනියන් තත්ත්වය ඉල්ලන අවධියේදී, ඊට විරෝධය පෑමේ පළමුවැනි රැස්වීමට ගොස් උද්ඝෝෂණය කිරීමෙන් ගුටි කා, බැට කා, ලේ හැළු කීප දෙනා ගෙන් එක්කෙනෙක් බව මේ රටේ නිදහස බුක්ති විඳින ජනතාවට අමතක කරන්නට බැහැයි කියන වික අපි සිහි ගන්වන්නට ඕනෑ.

ජීවාගේම, ලෙස්ලි ගුණවර්ධන මහත්මයා සමසමාජ ව්‍යාපාරයේ තීරණ ගැනීමේ කීපදෙනාගෙන් එක් කෙනෙක් හැටියටත් කාලයක් වැඩ කළා. එතුමාගේ අවසානය දක්වාම එතුමා ඒ කාර්ය භාරය ඉටු කළා. සමසමාජ පක්ෂය දෙකඩ වීමේදී ලෙස්ලි ගුණවර්ධන මහත්මයා බෝල්ෂෙවික් ලෙනිනිස්ට් පක්ෂයේ ඉන්දියානු ශාඛා පිළට එකතු වුණු බවත් ඉතිහාසය අනුව අප දන්නා සත්‍යයක්. මේ රටේ සුද්දන්ගේ පාලන ක්‍රමය අවසන් වනතුරු සමසමාජ පක්ෂය ඉෂ්ට කළ ඒ අමරණීය සේවාවේ ඊළඟට ජාතික වශයෙන් ඉටු කරන්න තිබුණු කටයුතු සම්බන්ධයෙන් විවිධ මත භේද මතු වුණු අවධියේදී ලෙස්ලි ගුණවර්ධන මහත්මයා ලංකා සමසමාජ පක්ෂයේ තීරණාත්මක වැදගත් පුද්ගලයෙක් බවට පත් වුණා. මම මේ ටික කිව්වේ, ලෙස්ලි ගුණවර්ධන මහත්මයා, සමසමාජ පක්ෂය මේ රටේ අනෙක් වාමාංශික පක්ෂ සමග එකතුව සිදු කළ සටන් සියල්ලේම හවුල්කාරයෙක් වශයෙන් ඒ සියල්ල දැන සිටි අයගෙන් කෙනෙක් බව අපට අමතක කරන්නට බැරි නිසායි.

අපි විශේෂයෙන් එතුමාගේ දක්ෂතාව දකින්නේ පොලිස් ඔත්තු සේවයට අසු නොවී, අත්–අඩංගුවට පත් නොවී සිටීමෙන් පමණක් නොවෙයි. එද පොලිස් ඔත්තු සේවය විසින් සොයනු ලැබූ අය මේ රටින් ඉන්දියාවට පිටත් කිරීමේ අවසන් තීන්දු සහ පරීක්ෂණයන් කළේ එතුමාද පොලිස් ඔත්තු සේවයට වුවමනා වුණු අවධියකදීම බව මේ වේලාවේදී මීට එකතු කළ යුතුයි.

මේ රටේ අද සිදු වී තිබෙන විශාල වෙනස ඇති කරන්නට තම ජීවිතය, තමන්ට හිමිව තිබුණු ලක්ෂ ගණන් ධන උල්පත් සියල්ලම රටත් ජනතාවත් වෙනුවෙන් කැප කිරීමෙන් ලෙස්ලි ගුණවර්ධන මහත්මයා දුන් ආදර්ශය අද මේ රටේ දේශපාලනයට අති වැදගත් වෙනවා.

මම පුංචි ළමයෙක් හැටියට ලැබූ අත්දැකීමක් අනුව මේ සභාවට මම එක් කරුණක් මතක් කළ යුතුයි. 1964 දී මේ රටේ වාමාංශික එක්සත් පෙරමුණ කැඩී යන වේලාවේදී ලෙස්ලි ගුණවර්ධන මහත්මයා දවසට තුන් හතර වර අපගේ ගෙදරට ඇවිත් ඒ සිදු වුණු ඛෙදවාචකය පිළිබඳව මගේ පියා සමග කීපවරක් කතා කළා. මම හිතන හැටියට, ඒ තීරණ ගැනීමේදී ලෙස්ලි ගුණවර්ධන මහත්මයා තම චින්තනය අනුව එයට විරුද්ධ වුණා. පසු කාලයකදී ලෙස්ලි ගුණවර්ධන මහත්මයාත් එයට එකතු වුණා. 1964 දී ඒ ඛෙදවාචකය සම්බන්ධව විවිධ ප්‍රශ්න නගද්දී ලෙස්ලි ගුණවර්ධන මහත්මයා එද ඒ වමේ පෙරමුණ ආරක්ෂා කිරීම සඳහා එතුමාට හැකි උපරිම සේවය ඉටු කළාය කියන එක මේ රටේ ඉතිහාසයේ ලකුණු විය යුතු නිසයි මම මේ කරුණු ස්වල්පය කිව්වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ කම්කරු ව්‍යාපාරය වෙනුවෙන් සහ විවිධ ව්‍යාපාර වෙනුවෙන් සමාජයට තමන්ගේ මිනිස් යුතුකම ඉටු කිරීමෙන් කළ සේවය ගැන මහජන එක්සත් පෙරමුණේ සද ගෞරවය ලෙස්ලි ගුණවර්ධන මැතිතුමාට හිමි කරමින් එතුමාගේ අභාවය ගැන අපගේ සංවේගයත් පවුලේ අයට දන්වා යවන මෙන් මා ඉල්ලා සිටිනවා.

ආනන්ද දසනායක මහතා (කොත්මලේ)
(திரு. ஆனந்த தஸநாயக்க—கொத்மலை)
(Mr. Ananda Dassanayake–Kotmale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කම්කරු නායකයකු වශයෙනුත් අභාවප්‍රාප්ත ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා සිහි කිරීම මගේ යුතුකමක්. මේ අවස්ථාවේදී අපි මතක් කළයුත්තේ ඈත අතීතය නොවෙයි; නුදුරු අතීතය ගැනයි. විශේෂයෙන්ම 1925 ත් 1947 ත් අතර කාලය තුළ ලංකාවේ දේශපාලන භූමියෙහි භයානක තත්ත්වයක් තිබුණේ ස්වදේශිකයන්ට. එද විදේශීය ආධිපත්‍යයක් බලපැවැත්වූ අවස්ථාවක දේශපාලනය කරන එක තරම් භයානක දෙයක් තවත් තිබුණාය කියා මා සිතන්නේ නැහැ. එවැනි අවදියක අභීතව එඩිතරව ඉදිරිපත් වූ කීප දෙනෙකු එද දේශපාලන බිමේ සිටියා. එයින් එක්කෙනෙකු ලෙස්ලි ගුණවර්ධන මහත්මයා බව අපි මේ අවස්ථාවේදී මතක් කළයුතුයි. විදේශීය ආධිපත්‍යට විරුද්ධව සටනක් ගෙන යන්නට එතුමා අනෙක් කණ්ඩායම්ද සමග අධිරාජ්‍ය විරෝධී සටන් මග හොඳම ආයුධය කර ගත්තා. විශේෂයෙන්ම ජාත්‍යන්තර සංවිධානත් සම්බන්ධ කරගෙනයි ඒ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට විරුද්ධව ඒ අයගේ පාලනය මේ රටෙන් ඉවත් කළයුතුය කියන සටන ගෙන ගියේ. එහි විශේෂ භරය එයයි. ඒ නිසාම තමයි ඒ අය අධිරාජ්‍ය විරෝධී ජාත්‍යන්තර සංවිධාන සමග එක් වුණේත්. ඒ පියවර ලංකාවේ උගතුන්ගෙන් වැඩි දෙනෙක් ඒ අවදියේදී පිළිගත්තා. ඒ කාලයේ ඒ සටන ජාතික සංගමය, සිංහල මහා සභාව වාගේ සංගම් එක හඬින් නැඟී සිටීමට ඒ සංගම් තුළ උනන්දුවක් උද්‍යෝගයක් ඇති කිරීමට තරම් හේතුවක් වුණා.

ලෙස්ලි ගුණවර්ධන මහත්මයා ඇතුළු පිරිස ඊළඟට උපයෝගී කර ගත්තා කම්කරු ව්‍යාපාරය. අධිරාජ්‍යයකට විරුද්ධව සටන් කරන්නට වෙනත් මගක් නැති නිසා කෙළින්ම සටනකට වදින්න බැරි නිසා කම්කරු සංවිධාන මඟින් රජයේ වැඩ කටයුතු විවේචනය කරමින් මහජනතාව රජය කෙරෙහි විරුද්ධ කරවීමට, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය අපට එපාය කියන මතය පෙන්නුම් කිරීමට එතුමන්ලා එද යම් උත්සාහයක් ගත්තාය කියන එක මේ අවස්ථාවේදී මතක් කළ යුතුයි. ඒ ව්‍යාපාරය නිසා තමයි අද වුණත්–කම්කරු ව්‍යාපාරය අපි කවුරු කළත් ඒ අයට ඒ ගෞරවය හිමි විය යුතුයි–අපි මේ වැඩ කටයුතු කරගෙන යන්නේ. ඒ අවදියේදී හිටපු කම්කරු නායකයින්–ඒ. ඊ. ගුණසිංහ වැනි අයත් එකතුව–අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව ගෙන ගිය සටන් නිසා තමයි අද අපි අපේම පාර්ලිමේන්තුවක ස්වදේශීය පාර්ලිමේන්තුවක ඉඳගෙන මේ වැඩ කටයුතු කරගෙන යන්නේ. ඒ පසුබිම සකස්කර දුන්නේ ඒ අය බව අපි අමතක නොකළ යුතුයි. ඒ අනුව ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා දේශපාලඥයකු වශයෙනුත්–යම් දේශපාලන දර්ශනයක එල්බ ගත් පුද්ගලයකු වශයෙන්–අධිරාජ්‍ය විරෝධී සටනේ පතාක යෝධයකු වශයෙනුත් ලංකාවේ වෘත්තීය සංගම් ව්‍යාපාරයේ ආරම්භක පුද්ගලයකු වශයෙනුත් විශාල සේවයක්, නොමැකෙන සේවයක්, ජනතාවගේ සුභ සිද්ධිය සඳහා කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපි එය කෘතඥ පූර්වකව මතක් කළ යුතුයි. එතුමාගේ අභාවය පිළිබඳ අප පළ කරන ශෝකය එතුමාගේ මැතිණියටත්, ඒවාගේම දරුවන්ටත්, ඥාතීන්ටත් දන්වා යවන හැටියට මම තමුන්නාන්සේගෙන් ඉල්ලනවා.

අනිල් මූණසිංහ මහතා (මතුගම)
(திரு. அனில் முனசிங்ஹ—மத்துகம)
(Mr. Anil Moonasinghe–Matugama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය යුගයේ, විශේෂයෙන් 1970 සිට 1978 දක්වා, ලෙස්ලි ගුණවර්ධන මැතිතුමත් බොහොම කිට්ටුවෙන් ආශ්‍රය කළ පුද්ගලයෙක් වශයෙන් මම හිතනවා, මමත් එතුමාගේ ශ්‍රේෂ්ඨ නාමය සිහි කරන මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කළ යුතුය කියා.

එතුමා ආශ්‍රය කරන විටයි අපට දැනගන්නට ලැබුණේ, පැති කිහිපයක් තිබෙනවාය කියා එතුමාගේ ජීවිතයේ. එතුමා හරිම නිහතමානියි. ඒවාගේම වචනයක් කිව්වොත් ඒ වචනය අකුරටම පිළිපදින ශක්තියක් තිබුණු පුද්ගලයෙක්, එතුමා. සමහරවිට එතුමාගේ තවත් පැති ජනතාවට එතරම් තේරුණේ නැහැ. සමාජවාදය ගැන එතුමාගේ තිබුණු දර්ශණය ඇතුළුකොට විශේෂයෙන් ලංකා සමසමාජ පක්ෂයේ දර්ශණය හුඟක් දුරට ඇති කළේ එතුමායි.

මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කිව්වා වාගේ බ්‍රිතාන්‍යයේ ඉගෙනුම ලබාගත් කිහිප දෙනෙක් අදහස් කළා, බ්‍රිතාන්‍යයට විරුද්ධව ලංකාවේ දේශපාලන පක්ෂයක් සාද පවත්වාගෙන යන්නට ඕනැය කියා. ඒ උදවිය අතරින් කිහිප දෙනෙක් තමයි මහරගම ගරු මන්ත්‍රීතුමාගේ පියා වන පිලිප් ගුණවර්ධන මහතා—ප්‍රධානියා වශයෙන් —ආචාර්ය එන්. එම්. පෙරේරා මහතා, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතා හා ලෙස්ලි ගුණවර්ධන මහතා යන අය. මේ හතරදෙනා කල්පනා කළා, ඒ සටනේදීම සමාජවාදය ඇති කරන්නටත් ඕනැය කියා. සමාජවාදී ක්‍රමයට රට නැඹුරු කරන්නට ඕනැය කියාත් ඒ අය කල්පනා කළා, ඒ සටන යද්දී. හැබැයි, ඔවුන් ඒ කාලයේදීම තීන්දු කර ගත්තා ලෝක සමාජවාදී ව්‍යාපාරයේ—විශේෂයෙන් රුසියාවේ විප්ලවයෙන් පසුව ඇතිවුණු යුගයේදී—රුසියාවේ දෙවැනි නායකයා වශයෙන් සිටි ලියොන් ට්‍රොට්ස්කිගේ අදහස් හරිය කියා. එසේ කල්පනා කළ එතුමන්ලා ලංකාවට ඇවිල්ලා ඒ අදහස් ඔස්සේ සමසමාජ පක්ෂය ඉදිරියට ගෙනයාමට අදහස් කළා. සමහරවිට න්‍යායික මත භේදයක් හැටියට සමහරුන්ට මෙය පෙනෙන්නට පුළුවන්. නමුත් මම හිතනවා ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා යුග දෙකක් අතරේ ජීවත්වුණු නිසා, ඒ දර්ශනික වෙනස්කම ඉතාමත්ම වැදගත් විධියට අප සැලකිය යුතුය කියා.

මට ප්‍රථමයෙන් කථා කළ ගරු මන්ත්‍රීවරුන් කිව්වා, එතුමාගේ ඒ අධිරාජ්‍ය විරෝධී සටන් ගැන. එනිසා මම ඒවා ගැන වැඩිය කථා කරන්න යන්නේ නැහැ. එක් කාරණයක් පමණක් මේ ගරු සභාව ඉදිරිපිට තබන්නට ඕනැ. එතුමා ලංකාවේ සිර අඩස්සියට නොවැටී ඉන්දියාවට ගොස්, ඉන්දියාවේ අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව ගෙන යන සටනට සහභාගී වී, ඒ භාෂාවල් කථා කරන්නේ නැතිව, හැබැයි ඒවා කථා කරන්න ඉගෙන ගෙන, ඉන්දියාවේ "බෝල්ෂෙවික් ලෙනිනිස්ට්" පක්ෂය ඇති කරමින් මේ රටවල් දෙක අතර තියෙන සම්බන්ධය වැඩි කරන්නට වැයම් කළාය කියා මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනැ. එතුමා ඉන්පසුව—විශේෂයෙන් 1956 ට පසුව—වැයමක් දැරුවා, ලංකා සමසමාජ පක්ෂයේ දර්ශනය මේ වෙනස්වීම් අනුව හැඩගස්වන්නට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දන්නවා, අපි මාක්ස්වාදීන් වශයෙන් පළමුවෙන්ම—[බාධා කිරීම්] ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටියට මම මාක්ස්වාදය හොදට හදරල තියෙන පුද්ගලයෙක්. [බාධා කිරීම්] මාක්ස්වාදීන් වශයෙන් ඒ කාලයේදී අපේ තිබුණු අදහසක් තමයි [බාධා කිරීම්].

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

කට බොරු කිව්වට දිව බොරු කියන්නේ නැහැ.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Anil Moonasinghe)

මාක්ස්වාදීන් වශයෙන් ඒ කාලයේදී අපේ තිබුණු අදහසක් තමයි, පාර්ලිමේන්තුවට අපි එන්නේ මේක වේදිකාවක් වශයෙන් පාවිච්චි කරන්නය කියා. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු ටිකක් ඇහුම්කන් දුන්නොත් ඉතාමත්ම වැදගත්. මොකද, ලංකා සමසමාජ පක්ෂයේ අපි ඒ දවස්වල ක්‍රමානුකූලව වැයම් කළා, පරණ අදහස් අත් හරිමින්,පාර්ලිමේන්තුව මාර්ගයෙන් සමාජවාදී සටන ගෙන යන්නට පුළුවන්ය කියන ස්ථාවරයට එන්න. එයට ප්‍රධාන වශයෙන් කටයුතු කළේ ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා කියා මේ අවස්ථාවේදී මම කියන්න ඕනැ. 1978 පැවැත්වූ ලංකා සමසමාජ පක්ෂයේ සම්මේලනයේදී මේ අදහස කෙළින්ම ප්‍රකාශ කර, පක්ෂයේ ප්‍රතිපත්තිවලට එය ඇතුල් කළා. අද මේ සභාවේ ඉදිරිපිට ආසනවල වාඩි වී සිටින ගරු මන්ත්‍රීවරු හිනා වුණා. හේතුව, මම දන්නේ නැහැ. එහෙත් අද මේ අදහස් හුඟක්දුරට යුරෝපීය කොමියුනිස්ට් පක්ෂ පවා පිළිගෙන තිබෙනවා. ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා ඒ ගැන—යුරෝ කොමියුනිස්ට් වාදය ගැන—ග්‍රන්ථයක් ලිව්වා. මේ පාර්ලිමේන්තු ක්‍රමයෙන් තමයි සමාජවාදයට යන්න ඕනැ කියා අද විශේෂයෙන්ම ඉතාලි කොමියුනිස්ට් පක්ෂය පිළිගෙන තිබෙනවා. ඒව වැදගත් දේවල්. තමුන්නාන්සේලා හිනා වුණාට, ටිකක් කල්පනා කළොත් පෙනේවි, මේක ඉතාම වැදගත් නැම්මක් කියා. එය මාක්සවාදීන්ට ඒ කාලයේදී කරන්න පුළුවන් වුණු නැම්මක්ය කියා තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනැ. මෙහිදී දර්ශනික වශයෙන් ඊයෙත් මේ ප්‍රශ්ණය පැන නැගුනා. විශේෂයෙන් අපි පාලනය—Controls—දනවද? සමාජවාදය කියන්නේ පාලන ක්‍රම වැඩිකිරීමක් කියා හුඟ දෙනෙක් කල්පනා කරනවා. ලංකා සමසමාජ පක්ෂය, එවකට මේක හොදට සාකච්ඡා කර තීන්දු කළා. පාලන ක්‍රම නොවෙයි අපට ඕනැ. සමහර විට ඒවා දන්න වෙනවා. සමාජවාදය කියන්නේ මිනිසාට පූර්ණ නිදහස ලබා ගෙන ජීවත්වීමයි කියා මම තමුන්නාන්සේලාට කියන්න ඕනැ. එය ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා ග්‍රන්ථ කිහිපයකින් හොදට ප්‍රකාශ කළා. එය අපි ඒ දවස්වල ක්‍රියාත්මක කරන්න හැදුවා. මම තමුන්නාන්සේට කියන්න ඕනැ, මා ලංගමයේ සභාපති වශයෙන් ඉන්න විට මගේ ඇමතිතුමා වශයෙන් හිටියේ ලෙස්ලි ගුණවර්ධන මැතිතුමායි. අපි එය සේවක මණ්ඩල පත් කිරීමෙන් ක්‍රියාත්මක කරන්න හැදුවා. මනුෂ්‍යයාගේ නියම නිදහස එන්නේ, නියම සමාජවාදයක් එන්නේ, මනුෂ්‍යයා ආණ්ඩු පාලනයට යට කරන්නේ නැතිව, පුළුවන් තරම් තමන්ට ස්වාධීනව කටයුතු කිරීමට ඉඩ දෙන විටයි කියා විශේෂයෙන් අපි පෙන්නුම් කරන්න හැදුවා. අන්න එම නිසායි, අප බැලූවේ සේවක මණ්ඩල මාර්ගයෙන් පුළුවන් තරම් ස්වයං පාලනයක් ඇති කරන්න. ඒ කියන්නේ, වැඩ පොලවල වැඩකරන කම්කරුවන්ට ඒවා පාලනය කිරීමේ බලය දෙන්න ඕනැය කියායි. හැබැයි, හිතුවක්කාර අන්දමට නොවෙයි, කිසියම් ක්‍රමයක් අනුව පාලනය කරන්නටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමා එද කිව්වා, මම එතුමා හම්බ වෙන්න ආවාය කියා. මම ආවා හම්බ වෙන්න. මම එද එතුමා හම්බ වෙන්න ඇවිත් මොනවාද කළේ? ලංකාවේ ගම්සභා සම්බන්යෙන් කළ යුතු දේවල් මොනවාද කියන කාරණය ගැන මම එතුමාට ලියවිල්ලක් භාර දුන්නා. එහෙම නැතුව යූඑන්පියට බැදෙන්න නොවෙයි. අවංකවම අපේ අදහස් කියන්නයි, ආවේ. විරුද්ධ පක්ෂයෙ සිටියත් මේ රට සැදීමේදී අපේ අදහස් ඉදිරිපත් කිරීමෙන් අපි උදව් කරන්න ඕනැ. ඒ කාලයේදී අපේ පක්ෂයෙන් කිසිවෙක් පාර්ලිමේන්තුවේ සිටියෙ නැහැ. දැනුත් ලංකා සමසමාජ පක්ෂයේ කවුරුත් නැහැ. එම නිසා මම එද කල්පනා කළා, ගරු අගමැතිතුමාට දෙන්න ඕනැය කියා—

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please!

This is an obituary speech. If you limit yourself to that it will be very helpful.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் மூனசிங்ஹ)
(Anil Moonasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්නට හැදුවේ එම යෝජනා සකස් කළේ නැසීගිය ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා බවයි. [බාධා කිරීමක්] මම ඒකටත් එන්නම්. නමුත් මෙතෙන්දී නොවෙයි. මම ඔය පැත්තට නම් කවදාවත් පනින්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කතා කරන්නෙ ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා ලංකා ඉතිහාසයට එක් කළ දේවල් ගැනයි. එතුමා දර්ශනික වශයෙනුත් ප්‍රායෝගික වශයෙනුත් කළ දේවල් මොනවාද කියා මතක් කර දීමටයි, අද මේ ගරු සභාවෙ මම කතා කරන්න අදහස් කළේ. එය එතුමාට කරන ගෞරවයක්. එතුමා පිළිබඳව හොඳ ගුණකථනයක් කළා. එයින් එහාට දර්ශනික වශයෙන් ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා සමාජවාදී ලෝකයට ඉදිරිපත් කළ අළුත් අදහස් අද දින මේ ගරු සභාවේදී කීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා, මේ කණගාටුදායක අවස්ථාවේදී වුණත්.

මම මෙයට වඩා කාලය ගන්නේ නැහැ. ඇත්තවශයෙන්ම එතුමාගේ අභාවය මම හිතන හැටියට ලංකාවේ සමාජවාදී ව්‍යාපාරයට සිදු වුණු විශාල පාඩුවක් ; රටට සිදු වුණු විශාල පාඩුවක් ; පානදුර ප්‍රදේශයට සිදු වුණු විශාල පාඩුවක්. මම හිතනවා එතුමාගේ නාමය බොහෝ කාලයක්—මේ රටේ කම්කරු සමාජවාදී ව්‍යාපාරය පවතින තාක් කල් නොවෙයි ඊට එහාටත්—පවතිනවාය කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රකාශ කළ මේ අදහස් සියල්ලක්ම එතුමාගේ පවුලටත්, එතුමා හිටපු පක්ෂයටත් යවන්නය කියා ගෞරවයෙන් තමුන්නාන්සේගෙන් ඉල්ලමින් මම නිහඬ වෙනවා.

මර්වින් ජේ. කූරේ මහතා (පානදුර)
(திரு. மேர்வின் ஜே. குரே—பாணந்துறை)
(Mr. Mervyn J. Cooray–Panadura)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පානදුරේ වර්තමාන මන්ත්‍රීවරයා වශයෙන් මගේ බරපතල යුතුකමක් තිබෙනවා, මීට ඉහත අවුරුදු විසි එකක පමණ කාලයක් පානදුරේ මන්ත්‍රීවරයා වශයෙන් සිටි ගරු ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී පානදුරේ ජනතාව වෙනුවෙන් අපේ ශෝකය එම පවුලේ උදවියට යැවීම පිණිස සටහන් කිරීමට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු විසි එකක පමණ කාලයක් පානදුර මන්ත්‍රීවරයා වශයෙන් ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා ඒ ආසනය නියෝජනය කළා. ඒ කාල සීමාව තුළදී යම්කිසි තරමක සේවාවක් එතුමාගෙන් පානදුර ජනතාවට සිද්ධ වුනා. දේශපාලන වශයෙන් එතුමාගේ පක්ෂ ප්‍රතිපත්ති අප පිළි නොගත්තත්,හොඳ මිනිසකු වශයෙන්, හොඳ හදවතක් ඇති හොඳ ගතිගුණ ඇති පුද්ගලයකු වශයෙන් පානදුර ජනතාව එතුමා පිළිගත්තා. නමුත් දේශපාලන වශයෙන් 1977 මැතිවරණයේදී පානදුරේ ජනතාව එතුමා පිළිගත්තේ නැහැ. 1970 සහ 1977 යන මැතිවරණ දෙකේදීම මම දේශපාලන වශයෙන් එතුමාගේ විරුද්ධවාදියෙක් හැටියට, එහෙම නැත්නම් එක්සත් ජාතික පක්ෂයේ ආධාරකාරයෙක් හැටියට සටන් කළා. අපි ඒ සටන් මෙහෙයවද්දී එතුමාගේ පක්ෂයේ උදවියත්, අපේ පාක්ෂිකයනුත් අතර නොයෙකුත් ප්‍රශ්න උඩ ගැටුම් ඇති වුණා.

.........*[Expunged – Vide Order by the Chair]*.........

එතුමාගේ පක්ෂයේ ප්‍රතිපත්ති නොපිළිගත්තත් එතුමාගේ තිබුණු හොඳ ගතිගුණ අපි පිළිගන්නවාය කියන එක කියන්න ඕනැ. ඒ වගේම ඒ හොඳ ගතිගුණ පානදුරේ ජනතාවත් පිළිගන්නවා. එතුමාගෙන් පානදුරේ ජනතාවට යම්කිසි සේවාවක් සිදුවුණා. ඒ වගේම හිටපු ප්‍රභූවරයෙක් හැටියට, බුද්ධිමතෙක් හැටියට, උගතෙක් හැටියට පානදුරේ ජනතාව තවමත් එතුමාට සලකනවා. එම නිසා, එතුමාගෙන් පානදුරේ ජනතාවට වුණු සේවාව සඳහන් කරන අතර එතුමාගේ අභාවය පිළිබඳව පානදුරේ ජනතාව ශෝක වන බවත් මතක් කරන්න කැමතියි. ඒබව එතුමාගේ පවුලේ උදවියට දැනුම් දෙන ලෙස මම ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා.

ආර්. ප්‍රේමදාස මහතා (අග්‍රාමාත්‍යතුමා, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා, මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(திரு. ஆர். பிரேமதாச—பிரதம அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(Mr. R. Premadasa–Prime Minister, Minister of Local Government, Housing and Construction, Minister of Highways, and Leader of the House of Parliament)

නියෝජ්‍ය කථානායකතුමනි, දිවංගත ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා පාර්ලිමේන්තුවේ ඉතාම දීර්ඝ කාලයක් සේවය කළ මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම එතුමා පසු කාලයක ඇමතිවරයෙක් හැටියටත් සේවය කළා. එතුමාගේ නම මට ප්‍රථම වරට දැන-කියා ගන්න ලැබුණේ එතුමා නීතිඥයෙක් හැටියට මුලින්ම ලියපු පොතක් නිසයි. මම පුස්තකාලයාධිපතිතුමාට පණිවුඩයක් යැව්වා, ඒ පොත තිබෙනවාද කියා බලන්න. 'මගේ නීතිඥයා' කියන ඒ පොත මා ගාව නම් තිබෙනවා.

මගේ හිතේ, එතුමා ප්‍රථමයෙන්ම ලියපු පොතක් තමයි, 'මගේ නීතිඥයා' කියන ඒ පොත. ඒක තේරුමක් ඇතිව, සාමාන්‍ය රටවැසියාට නීතිය පිළිබඳව දැනුමක් ලබා දෙන්න ලියපු පොතක්. එතුමාට පෙනුණා, නීතිය ගැන නොදැනුවත්කම නිසා බොහොම අහිංසක උදවිය අමාරුවේ වැටෙන බව. ඒ නිසා බොහොම සරල, සුගම සිංහල බසින් එතුමා ඒ පොත ලියා තිබුණා. මුලිනුත් සඳහන් කළ පරිදි මම ප්‍රථම වරට එතුමා ගැන දැන-කියා ගත්තේ ඒ පොතෙනුයි. ඊට පසුව යුද්ධ කාලයේ, බ්‍රිතාන්‍ය ආණ්ඩුව මේ රට පාලනය කළ කාලයේ, දේශපාලන සිරකාරයෙක් හැටියට ලෙස්ලි ගුණවර්ධන මහතා පිළිබඳ තොරතුරු අපි නිතර නිතර ඇසුවා ; කියෙව්වා. ඒ ඉතිහාසයෙන් බිඳක් මීට කලින් මේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රකාශ වුණා.

ඒ කාලයේ තිබුණු රසවත් කතාවක් මට මේ අවස්ථාවේ මතක් වෙනවා. එදා ස්වදේශ ඇමති ධුරය දැරුවේ ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මැතිතුමායි. ලෙස්ලි ගුණවර්ධන මහතා සිරභාරයට පත් වන්නේ නැතිව බ්‍රිතාන්‍ය නිලධාරීන්ගේ ඇස්වලට වැලි ගසමින් සැඟවී සිටි කාලයේ ඔහු නිතර නිතර මේ නගරයේ සැරිසැරූ බව කවුරුත් දැනගෙන හිටියා. ශ්‍රීමත් ජයතිලක මැතිතුමාගේ නිවසේ තිබුණු සාංඝික දානයකට ලෙස්ලි ගුණවර්ධන මහතා භික්ෂූන් වහන්සේ නමක් ලෙසින් පැමිණ දන් වළඳා ගියා කියන එකත් ප්‍රකටව තිබුණු කතාවක්. එමෙන්ම එතුමා සිරභාරයට අසු නොවී, සැඟවී සිටීමෙන් එතුමා මතු කොට පෙන්නුවේ බියසුළු කමක් නොවෙයි ; වුවමනා නම් හිරු නොබසින අධිරාජ්‍යයේ රැහැන්වලට අසු නොවී සිටින්නට පුළුවන් ශූරත්වයක් ලාංකිකයින්ට තිබෙනවා කියන එකයි. මගේ පියා ඒ දවස්වල කිව්වා සුදු පොලිස් නිලධාරීන් පවා ඒ ගැන මවිත වුණා කියා. ඒ විධියට ක්‍රියා කිරීමට තරම් ආත්ම ශක්තියක් එතුමාට තිබුණා.

එතුමා පිළිගෙන තිබුණු දේශපාලන දර්ශනය ගැනත් මේ ගරු සභාවේ දී දැන් කියැවුණා. ඒ දර්ශනය පිළිගත් නායකයින් අතර ඒ දර්ශනය අවංකවම පිළිගත් නායකයින් කිපදෙනෙක් ගැන අපි දන්නවා. ඒ අය අතරත් ලෙස්ලි ගුණවර්ධන මහතා අවංකවම මාක්ස්වාදය විශ්වාස කළ මාක්ස්වාදියෙක් කියා මට කියන්න පුළුවන්. එතුමා අවංකවම මාක්ස්වාදය විශ්වාස කළා. මා මෙය කියන විට තමුන්නාන්සේලා හිතනවා ඇති මාක්ස්වාදය විශ්වාස නොකරන මාක්ස්වාදීනුත් සිටිනවාද කියා. එහෙම හිතෙනවා නම් මට ඒ ගැන කරන්න දෙයක් නැහැ. මාක්ස්වාදය ගැන දැඩි විශ්වාසයකින් යුතුව එතුමාගේ දේශපාලන ජීවිතය නිරන්තරවම ඒ පදනම උඩ ගෙන ගියා කියා මා කල්පනා කරනවා. අපි කාටත් එසේ කල්පනා වෙයි. එතුමා මොනම අවස්ථාවකවත් ඒ හා සමග ගනුදෙනුවක් කර ගන්නට ලැහැස්ති වුණේ නැහැ.

1964 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සමග එකතුවීමේ ප්‍රශ්නය ඉදිරිපත් වූ අවස්ථාව මට මතකයි. ඊට මාස කීපයකට කලින් සමසමාජ-කොමියුනිස්ට්-මහජන එක්සත් පෙරමුණ කියන පක්ෂ තුනේ නායකයින් සම්බන්ධයක් ඇතිව ගෝල්ෆේස් පිට්යේ විශාල රැස්වීමක් පැවැත්වුවා. මා හිතනවා මහරගම ගරු මන්ත්‍රීතුමාත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(දිනේෂ් ගුණවර්ධන මහතා) ඒ ගැන සඳහන් කළා කියා. ඊට මාස කිහිපයකට පසුව තමයි. හදිසියේම නුවරඑළියේ අගමැති මන්දිරයේ පැවැති ක්‍රිකට් මැච් එකකින් පසුව, ඒ වාමාංශික එක්සත් පෙරමුණ කැඩී බිඳී ගොස් වෙනත් හවුලක් ඇතිවන්නට අවස්ථාව උදා වුණේ. මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කිව්වා වාගේ ඒ වෙලාවේ බොහොම දුකට පත් වුණු අයගෙන් කෙනෙක් තමයි ලෙස්ලි ගුණවර්ධන මහත්මයා. වෙන කිසිවක් නිසා නොවෙයි, තමන් පිළිගත් දේශපාලන දර්ශනය කෙරෙහි එතුමා තුළ ඒ තරම් දැඩි විශ්වාසයක් තිබුණු නිසයි. පසු කාලයකදී නැවත වාරයක් සභාග රජයක් ඇතිවන්නට ගිය අවස්ථාවේදී, ඒ මහ මැතිවරණයේදී, එදා බලයට පත් වූ පක්ෂ මහජනයා ඉදිරියට ගියේ විශෙෂ සම්මුතියක් ඇතිවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි 1970 දී ඒ සභාග රජය බලයට පත් වන්නට යෙදුණේ.

එදා එතුමා ඇමතිවරයෙක් හැටියට පත් වුණා. මගේ හිතේ එතුමාගෙ මුළු දේශපාලන ජීවිතයේම ඉතාම දුඃඛිත කාල පරිච්ඡේදය ආරම්භ වුණේ 1970-75 අතරයි. එතුමාගෙ හිතට එකඟව කිසිම දෙයක් කරන්නට බැරි දේශපාලන වාතාවරණයක සිරකරුවෙක් බවට එතුමා පත් වුණා. ඒක කවුරුත් දන්නා ප්‍රකට කරුණක්.

මම වැයම් කරන්නේ එතුමාගේ දේශපාලන ජීවිතයේ පදනම මාක්ස්වාදය මත රැඳී තිබුණු බව පෙන්වන්නටයි. ඒකයි මම කිව්වෙ මාක්ස්වාදය කෙරෙහි එතුමා තුළ අවංකව විශාල විශ්වාසයක් තිබුණාය කියා. ඒ දර්ශනපථය මඟින් මේ රටේ ප්‍රශ්නවලට පිළිතුරු සොයන්නට පුළුවන් වේය කියන අවංක හැඟීමක් එතුමා තුළ තිබුණා. ඒ අවංක හැඟීමෙනුයි එතුමා ක්‍රියා කෙළේ. නමුත් ඒකට බාධාවල් තිබුණා. ඒ දේශපාලන දර්ශනය හා ක්‍රියා මාර්ග පිළිබඳ අප අප අතර නොයෙකුත් වාද භේද තිබෙනවා ; වෙනස්කම් තිබෙනවා. ඒක වෙනම ප්‍රශ්නයක්. එක පුද්ගලයෙක් ගැන කල්පනා කරන විට අපි පුළුවන් තරම් උත්සාහ කරන්න ඕනෑ ඒ පුද්ගලයාගේ අඩුපාඩුකම්වලට වඩා, දුර්වලකම්වලට වඩා, එතුමාගේ ශක්තිමත් චරිතාංග මොනවාද කියා සොයාගෙන ඒවායින් යම්කිසි ආභාෂයක් ලබන්න.

විශේෂයෙන් මෙවැනි අවස්ථාවකදී අපේ ගෞරවය පිරිනමන විට මගෙ හිතේ අපි හැම විටම ක්‍රියා කළ යුත්තේ, කල්පනා කළ යුත්තේ, ඒ පුද්ගලයාගේ දේශපාලන ජීවිතයෙනුත් පෞද්ගලික ජීවිතයෙනුත් අපට ආශ්වාදයක් හැටියට ආදර්ශයක් හැටියට කුමක් ලබාගන්නට පුළුවන්ද කියන කාරණය ගැනයි. ඒ අතින් කල්පනා කරන විට තමන් විශ්වාස කළ දේශපාලන දර්ශනය, ක්‍රියා මාර්ගය කෙරෙහි තිබුණු පුදුම ඇප වීම කැප වීම අපට කිසිසේත් අමතක කරන්නට පුළුවන්කමක් නැහැ.

නියෝජ්‍ය කථානායකතුමනි, අද ලෙස්ලි ගුණවර්ධන මහතාට උපහාර දක්වමින් කළ කථාවල ඇතැම් අදහස් එතුමා මිය ගියාට පස්සෙ කළ එක වඩා හොඳයි කියන එකයි මම කල්පනා කරන්නෙ. ඒවා එහෙම අහගෙන සිටියා නම් එතුමා ඇතැම් විට බලවත් සේ කනගාටු වනවාට කිසිම සැකයක් නැහැ. එපමණක් නොවෙයි, එතුමාම කියන්න පුළුවන් මගේ අදහස් නොවෙයි ඕවා කියා. ඒ නිසා මම කැමති නැහැ එතුමා මොන ආකාරයට ඒ දේශපාලන දර්ශනය හා ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කරන්නට ක්‍රියා කළාද කියන්න. මොකද, මට නම් පුළුවන් කමක් නැහැ මගේ දේශපාලන ක්‍රියාදමයට එයින් කිසිම රුකුලක් ලබාගැනීමට.

ඒ වාගේම මම කියන්න කැමතියි, කලවාන ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මහතා) එතුමාගේ කථාවේදී කිව්වා අද සිහි කටයුතු දිනයක්, එතුමාට උපහාර දක්වන මේ අවස්ථාවේදී එතුමාගේ දයාබර බිරිඳට වෙච්ච අනවරයකට සුප්‍රීම් උසාවියෙන් තීරණයක් දුන්නාය කියා ඒ බිරිඳට වාසි වන හැටියට. මගෙ හිතේ අද ලෙස්ලි ගුණවර්ධන මහතා ජීවතුන් අතර සිටියා නම් අද විශාල සතුටකට පත් වෙනවා, මේ විධියේ සාධාරණ පාලන තන්ත්‍රයක් ලංකාවේ ඇති වී පවතිනවා නොවේද කියන එක ගැන. මන්ද? රාජ්‍ය නිලධාරියෙක් අතින් පවා සිදු වුණු වරදකට වන්දියක් ලබා දීමට තරම් අධිකරණය ස්වාධීන වේවි කියා මම කවදාවත් හිතුවෙ නැත. අද ඒ තත්ත්වය ඇති වී තිබෙනවාය කියා විශේෂ සතුටකට එතුමා පත් වෙනවා ඇති.

අපේ උපහාරය මේ අවස්ථාවේදී එතුමාගේ බිරිඳට හා දරුවන් ඇතුළු පවුලට මම පිරිනමන්න කැමතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

It is with great reluctance that I wish to use my powers under Section 77 of the Standing Orders and order the Secretary-General to expunge from these proceedings any statements which cause any irreverence or disrespect to such a noble person.

I wish to associate myself with the sentiments expressed by both sides of Parliament on the death of Mr. Leslie Gunawardene, ex-member of Parliament. I shall direct the Secretary-General of Parliament to make a minute of the proceedings of the meeting today and send a copy thereof to the members of the bereaved family.

We will suspend the sitting now for tea and after resumption we will take the Vote of Condolence in respect of the late Mr. Stanley Molligoda, ex-member of Parliament.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 5.00 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு பி. ப. 5 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 5 p.m. *and then resumed.*

ශෝක ප්‍රකාශය: ස්ටැන්ලි මොල්ලිගොඩ මහතා

அனுதாபத் தீர்மானம் : திரு. ஸ்ரான்லி மொல்லிகொட

VOTE OF CONDOLENCE: MR. STANLEY MOLLIGODA

එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(திரு. எம். வின்சன்ற் பெரேரா—பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)
(Mr. M. Vincent Perera–Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

Mr. Deputy Speaker, I rise today with a deep sense of loss to move a Vote of Condolence on the passing away of Mr. Liyanage Stanley Somaratne Molligoda, Attorney-at-Law, who represented the constituency of Nivitigala in the House of Representatives from 1960 to 1964. He was born on August 20th, 1936 and died in Colombo in April at the comparatively young age of 47 years

Stanley Molligoda received his education at Ananda College, Colombo, and thereafter read for his law degree at the University of Ceylon, Peradeniya. He did not confine himself to books alone but took an active interest in the life around school and University. He was a member of the English bating teams both at Ananda College and at the university. He was Captain of the Jayatilleke Hall Tennis team and also won his

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. වින්සන්ට් පෙරේරා මහතා]

cricket colours. He was elected Treasurer of the University Law Society and Played an active role in the Communist Youth Movement in the campus.

A landed proprieter, he served for a short period on the staff of the Nivitagala Maha Vidyalaya.

Mr. Stanley Molligoda who contested the general election of July 1960 as the Sri Lanka Freedom Party nominee was returned as a Member for Nivitigala witha majority of 1,720 votes. He took a keen interest in youth affairs and made a goodwill tour of India and Nepal at the invitation of the All India Youth Federation.

Stanley is remembered with affection by his constituents for his contribution in the fields of agriculture, rural development and education. He strongly advocated the ceylonisation of the foreign owned estates and state take-over of schools. His pet topic in Parliament was the problem of the Kandyan peasant. He took a keen interest in the implementation of the Kandyan Peasantry Commission proposals, particularly in the Sabaragamuwa province.

Mr. Molligoda was appointed a Director of the Milk Board in March 1968. He was serving as a member of the Land Reform Commission at the time of his death. His untimely death is a loss to the country.

Mr. Deputy Speaker, I propose that the condolence of this House be conveyed to the members of the bereaved family.

එම්. සිවසිතම්පරම් මහතා (නල්ලූර්)
(திரு. எம். சிவசிதம்பரம்—நல்லூர்)
(Mr. M. Sivasithamparam–Nallur)

On behalf of the Tamil United Liberation Front I associate myself with the sentiments expressed by the Hon. Minister of Parliamentary Affairs and Sports on the untimely death of Stanley Molligoda. Mr. Stanley Molligoda, as was pointed out by the Hon. Minister, interested himself in national politics while he was yet a student in the university. He not only took part in the lively debates of the university Council but he also interested in the political movement outside the University.

Soon after his university carrer he entered Parliament and he was in this House for four or five years. We all knew him ; we used to like him for his sense of humour and the lively speeches he made particularly about the Kandyan peasants. His name sometimes used to lend itself rather to jokes about him. He had one quality. He used to take them in a very good spirit as indeed every Member of Parliament should take such jokes. We join the Hon. Minister in requesting to make a minute of these proceedings and that it be forwarded to the members of the bereaved family.

ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—அத்தனகல்ல)
(Mr. Lakshman Jayakody–Attanagalla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1960 දී අප මුල්වරට මේ ගරු සභාවට පිවිසෙන අවස්ථාවේදී ස්ටැන්ලි මොල්ලිගොඩ මහතා අපත් සමඟ එද තරුණ මන්ත්‍රීවරයෙක් හැටියට පාර්ලිමේන්තුවට පැමිණියා මට මතකයි. අප තරුණයන්ව සිටි ඒ වකවානුවේදී, මට කලින් කථා කළ නල්ලූර් ගරු මන්ත්‍රීතුමා (එම්. සිවසිතම්පරම් මහතා) කීවාක් මෙන් ස්ටැන්ලි මොල්ලිගොඩ මහතා ගේ විවිධ හාස්‍ය කථා යනාදි දේවල් මේ අවස්ථාවේදී සිහිපත් වෙනවා.

මා හිතන්නේ ස්ටැන්ලි මොල්ලිගොඩ මහත්මයා උගත් තත්ත්වයක හිටපු කෙනෙක්. නමුත් ඒ උගත් භාවයට ඉහළින් හිතවත් භාවය යනාදි දේ හුවා දැක්වීම සඳහා අපත් සමඟ හොඳින් විහිළු තහළු කරමින් ප්‍රීතිමත්ව කාලය ගත කළ කෙනෙක්. ඔහු දුම්බීමෙන් වැළකී සිටියා. ඔහු සුරාපානයෙනුත් වැළකී සිටියා. ඔහු අවිවාහක පුද්ගලයෙක් වශයෙන් හිටියේ. ඔහු කවදාවත් චිත්‍රපටයක් බලන්නට ගියේ නැහැ. ඔහු නාට්‍යයක් නරඹන්නට ගියේත් නැහැ. එක අතකින් කල්පනා කර බලන විට හැම අවස්ථාවකදීම ඔහු කල්පනා කළේ ජීවිතයේ වෙනත් අංශයක්; වෙනත් පැත්තක්. මේ විධියට කල්පනා කලාම, ස්ටැන්ලි ටිකක් ගැඹුරු විධියට ජීවිතය ගත කළ කෙනෙක් බව පෙනෙනවා. අන්න එම නිසා පිටත පෙනුණු තැනැත්තා නොවෙයි, ඇතුළේ සිටි ස්ටැන්ලි. එවැනි පුදුමාකාර චරිතයක් තිබුණු කෙනෙක් හැටියට අපට ස්ටැන්ලි මොල්ලිගොඩ මහත්මයා සිහිපත් වෙනවා.

1964–1965 වර්ෂවලදී පමණ ඔහු අපෙන් වෙන්වුණා එතුමා දේශපාලන තීරණයක් ගත්තා. ඒ තීරණයෙන් පසු අපේ සම්බන්ධීකරණය අඩු වේගෙන ගියා. නමුත් පෞද්ගලික වශයෙන් ඕනෑම තැනකදී මුණ ගැසුණු විට පැරණි දැන හැඳුනුම්කම් අත හැරියේ නැහැ. හොඳින් කථාබහ කළා; හොඳින් ආශ්‍රය කළා. එතුමා බොහොම බාල වයසේදීම අභාවප්‍රාප්ත වීම අප කීසි කෙනෙකුට හිතන්නට බැරි දෙයක්. නමුත් එය එසේම සිදු වුණා. එතුමාගේ වියෝව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටින අප ඉතා කම්පනයට පත්වන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් තමුන්නාන්සේගේ මාර්ගයෙන් අපේ පක්ෂයේ තිබෙන්නා වූ ශෝකය එතුමාගේ ඥාතීන්ට දන්වා යවන ලෙස ඉල්ලමින් මා නිහඬ වෙනවා.

එම්. හලීම් ඉෂාක් මහතා (මැද කොළඹ තුන්වන)
(ஜனாப் எம். ஹலீம் இஷாக்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)
(Mr. M. Haleem Ishak–Third Colombo Central)

Mr. Deputy Speaker, Sir, I wish to associate myself with the Vote of Condolence moved by the Hon. Minister of Parliamentary Affairs and Sports on the death of Mr. Stanley Molligoda, Ex-Member for Nivithigala.

I have known Mr. Molligoda for many years. He was a very kind man ; a man who was really concerned about the affairs of this constituency.

After passing out as a Graduate from the Ceylon University, he passed out as an Advocate of the Ceylon Law College and for many years he was practising in Kandy. He had a fairly good practice and it was only very recently that he decided to settle down in Colombo and practise in Colombo.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Mr. Molligoda, during his time as a Parliamentarian, always fought for the causes he stood. He was least concerned about others' opinion. By conviction he was a man who though that the ordinary people of this country whom he represented were oppressed. Mr. Molligoda's death is a loss to the poor people of this country.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)

(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)

(Mr. Sarath Muttetuwegama–Kalawana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශිෂ්‍ය කාලයේ සිටම ස්ටැන්ලි මොල්ලිගොඩ මහත්මයා හඳුනන කෙනෙකු හැටියටත්, ඔහු නියෝජනය කළ ඡන්ද කොට්ඨාශයට ආසන්න ඡන්ද කොට්ඨාශයක් නියෝජනය කරන කෙනෙකු හැටියටත්, ඔහු පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් වුණු අවස්ථාවේදී වචන ස්වල්පයක් කතා කිරීමට මම බලාපොරොත්තු වෙනවා. මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම කිව්ව ආකාරයට ස්ටැන්ලි මොල්ලිගොඩ මහත්මයා කාරුණික හදවතක් තිබුණ පුද්ගලයෙක්. මම දන්නා තරමට කිසිම කෙනෙකුට කිසිම අවස්ථාවක වරදක් නොකළ පුද්ගලයෙක් හැටියට හඳුන්වන්න පුළුවන්. කිසිම ද්වේශ සහගත සිතක් ඔහුට කිසිම වෙලාවක නොතිබුණ බව ඔහු සමග ආශ්‍රය කළ සියලු දෙනාම දන්නා කාරණයක්. ඔහු ළඟ ලොකු ආත්මාර්ථකාමීත්වයක් තිබුණෙත් නැහැ. ඔහු මන්ත්‍රීවරයෙකු හැටියට තරග කරන බව ඇසූ විට මම පුදුම වුණා. මන්ද? එවැනි කිසිම බලාපොරොත්තුවක් තිබෙන බවවත් ඔහු අපට අඟවා තිබුණේ නැහැ. කෙසේ වෙතත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයෙකු හැටියට ඔහු 1960 ජූලි මැතිවරණයේදී තරග කර, මේ සභාවට ඇවිත් අවුරුදු කීපයක්ම මේ සභාවේ කටයුතු කළා. මා හිතන හැටියට ඒ ආණ්ඩුවේ අවසාන කාලයේදී, ඔහු එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වුණා. කෙසේ වෙතත් ඔහු ගැන දන්නා හඳුනන සැම දෙනෙක්ම ඔහුගේ මරණය පිළිබඳව, විශේෂයෙන්ම අකල් මරණය පිළිබඳව කණගාටු වුණු බව මේ සභාවේදී ප්‍රකාශ කළ යුතුව තිබෙනවා

ෂෙල්ටන් රණරාජා මහතා (අධිකරණ නියෝජ්‍ය ඇමතිතුමා)

(திரு. ஷெல்டன் றணராஜா—நீதிப் பிரதி அமைச்சர்)

(Mr. Shelton Ranaraja–Deputy Minister of Justice)

I wish to pay my tribute to the memory of a very close and dear friend of mine, Mr. Stanley Molligoda. I had known him for about 25 years, and as a matter of fact in July 1960, Mr. Molligoda and I entered this House, both as Members of the Sri Lanka Freedom Party. Both of us had the same misfortune of being expelled together on the same date from the S.L.F.P. in 1964. As I said, I have known him for a number of years and have had very close associations with him. I must say Mr. Stanley Molligoda was a very sincere friend. He was an honest, incorruptable politician and a good lawyer.

In 1960, I remember, when he entered Parliament, he was one who fought against corruption. I remember in 1962, there was a Bill brought by the hon. Leader of the Opposition, Mr. Dudley Senanayake, a "Private Member's Bill" to disqualify those persons who were found guilty of corruption by the Talgodapitiya Commission. He was one of those who, although in the Government voted for that "Private Members' Bill." Then again in 1964, I remember, when a Bill was brought to gag the Press–it was called "The Press Bill"–he was one of those who voted against the Bill. Although in the Government, and as a result he was expelled from the S.L.F.P. After being expelled from the S.L.F.P. he joined the UNP, and in 1965 at the General Election he recontested the Nivitigala seat as a United National Party member. He lost that seat, but that did not deter him from pursuing his studies further. Although he was in the University in 1958 he could not continue legal studies. But, after he lost his seat in Parliament in 1965 he joined the Law College and qualified as an Advocate. At that time I remember the Government appointed him as a working Director in the National Milk Board. He served on that Board with great efficiency. In 1970 after qualifying as an Advocate he came to Kandy and set up a practice. I must say that he enjoyed a very lucrative practice there. He was able to win the confidence of both his clients and the judges. He was very popular in Kandy. Although he did not take an active part after 1965 in politics, he engaged himself in the activities of various social service organizations in Kandy. Mr. Stanley Molligoda was one of those persons who was honest, sincere and free from corruption. It is a great loss to the Members of this house who knew him.

May I join in asking you, Mr. Deputy Speaker, to make a record of this proceedings and send a copy thereof to the members of the bereaved family. I think there is one sister who is still alive and it will be of great consolation to her to know what his friends and Colleagues of this House thought about him.

ආනන්ද දසනායක මහතා (කොත්මලේ)

(திரு. ஆனந்த தஸநாயக்க—கொத்மலை)

(Mr. Ananda Dassanayake–Kotmale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ටැන්ලි මොල්ලිගොඩ මහත්මයා 1960 ජූලි මැතිවරණයේදී නිවිතිගල ආසනය දිනාගෙන පාර්ලිමේන්තුවට ආවා. ඒ අවස්ථාවේදී මා සෙනෙට් මන්ත්‍රීවරයෙකු වශයෙන් සිටියත් ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ රැස්වීමට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරුන් හා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරුන් සියලු දෙනාම සහභාගී වුණා. මා හිතන විධියට, ස්ටැන්ලි මොල්ලිගොඩ මහත්මයා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් මුලදී, සමහර වෙලාවට පාර්ලිමේන්තුව පිරෙන තරමටම සෙනඟ කැඳවාගෙන ඇවිත් ඒ අයගේ දුක සැප විමසීමේ සිරිතක් පවත්වාගෙන ගියා. නමුත් කල් යාමේදී ටිකෙන් ටික ඒ සිරිත අත්හරින්න යෙදුනා. අන්තිමේදී මොන හේතුවක් නිසාද දන්නේ නැහැ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙනුත් එතුමා වෙන් වෙන්න අදහස් කළා.

ඊටපසුව 1965 දී පමණක් එතුමා තරග කළා. ඉන්පසුව පාර්ලිමේන්තු ආසනයකට තරග කිරීමේ ආසාව අත්හැර දැම්මා. එතුමා කිරි මණ්ඩලයේ කාලයක් සිටි බවත් අපි දන්නවා. අධිනීතිඥයෙකු වශයෙන් කටයුතු කරද්දී එතුමා නුවරදී මට මුණ ගැහුනා. නුවර සුප්‍රීම් උසාවියේදීත්, අනිකුත් උසාවිවලදීත්, ඒ වගේම ගම්පොල උසාවියේදීත් එතුමා මට මුණගැසී තිබෙනවා. එතුමා සෑහෙන තරම් දක්ෂ අධිනීතිඥයෙක් බවත් අපි දන්නවා. මන්ද? බොහෝ දෙනා අපට කියා තිබෙනවා ඒ උදවියගේ නඩුවලට කතා කිරීමට එතුමාව අල්ලලා දෙන්නය කියා. එයින් පෙනෙන්නේ ඒ සම්බන්ධයෙන් සෑහෙන දක්ෂකමක් එතුමාට තිබුණ බවයි. ඒ වගේම සමාජ සේවය සම්බන්ධයෙනුත් එතුමාට සෑහෙන දක්ෂකමක් තිබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අන්තිමට එතුමා දුටුවේ කොත්මලේදීයි. ගරු ජනාධිපතිතුමා කොත්මලේ තිබුණ උත්සවයකට සහභාගි වීමට ගොස් එහි විහාරයකට මුල් ගල් තබන අවස්ථාවේදී මේ අධිනීතිඥතුමා මට මුණගැසුනා. මුණ ගැහිලා අර කලින් තිබුණු අඹයාලූකමට, පුරුද්දට—මේ ගරු සභාවේදී නොකිව යුතු වචනයක් වුණත් මම එය කියන්නම්—'අඩෝ' කියලයි කථා කලේ. ඒ ආදරයට. 'අඩෝ! ආනන්ද' කියලයි කථා කලේ. අපිත් එහෙමයි, හිතවත්කමට ඒ වචනයමයි අතික් අතටත් පාවිච්චි කරන්නේ. ස්ටැන්ලි මොල්ලිගොඩ මහතා ඒ විධියේ හොඳ නිහතමානී ගතිගුණ ඇති පුද්ගලයෙක්. ඒ වෙහෙරට මුල් ගල තැබූ දවසෙයි එතුමා මට අවසාන වරට හමු වුණේ. එය මගේ මතකයේ තවමත් තිබෙනවා. මම හිතන හැටියට එතුමා රටට හොඳ සේවයක් කලා. අධිකරණය වෙනුවෙන් හෝ තවදුරටත් සේවයක් කරන්නට එතුමාට අවස්ථාව නොලැබීම ඇත්ත වශයෙන්ම අභාග්‍යයක් කොට අපි සලකන්නට ඕනෑ. එතුමා කල සේවය අපි අගයනවා. විශේෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙක් වශයෙන් එතුමා කල සේවය අපි අගයනවා. ඒ අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගෞරවය හා කණගාටුව එතුමාගේ පවුලේ අයට දන්වන ලෙස තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

I wish to associate myself with the sentiments expressed by both sides of Parliament on the death of Mr. Stanley Molligoda ex-Member of Parliament. I shall direct the Secretary-General of Parliament to make a minute of the proceedings of the meeting today and send copies thereof to the members of the bereaved family.

* * * * * * *

[ඉතිරි වැඩ කටයුතු සඳහා 1983 ජුනි 8 වන බදාද නිල වාර්තාවේ II වන කොටස බලන්න.]
[நிகழ்ச்சித் தொடரை 1983 ஜூன் 8, புதன்கிழமைய அதிகார அறிக்கையின் பகுதி II இற் பார்க்க.]
[*For continuation of Proceedings, see Part II of* OFFICIAL REPORT *for Wednesday 8th June 1983*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මීත් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

1983 ජූනි 22 වන බදාදා

නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි.

குறிப்பு

அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு

1983 ஜூன் 22, புதன்கிழமைக்குப் பிந்தாமற்

கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD,

not later than

Wednesday, 22nd June 1983

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org